# MONEY, BANKS
# &
# PRICE LEVELS
# (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# මුදල්

භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමේ දී ගෙවීම් මාධ්‍යයක් වශයෙන් පොදුවේ පිළිගන්නා වූ ඕනෑ ම දෙයක් මුදල් වශයෙන් සලකනු ලැබේ.

## හොඳ මුදලක ලක්ෂණ

- පොදු පිළිගැනීමක් තිබීම
- කල්පැවැත්ම
- සමජාතීය බව
- කුඩා කොටස්වලට බෙදිය හැකි වීම
- පහසුවෙන් එහා මෙහා ගෙනයාමට හැකි වීම
- වටිනාකම ස්ථාවර ව පැවතීම
- නීත්‍යානුකූල වලංගු භාවය
- සුලබ හෝ දුර්ලභ හෝ නොවීම
- අනුකරණය කළ නොහැකි වීම
- පහසුවෙන් හඳුනාගත හැකි වීම

ClassNote.LK

# මුදලේ ප්‍රධාන කාර්යයන්

- විනිමය (ගෙවීම්) මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම
- වටිනාකමේ සන්නිධියත් ලෙස කටයුතු කිරීම
- ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම
- විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම (කල්පසු වූ ගෙවුම් මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම)

ClassNote.LK

# විනිමය (ගෙවීම්) මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම

විනිමය මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම යනුවෙන් අදහස් කරන්නේ ගනුදෙනු කිරීමේ දී නැතහොත් භාණ්ඩ හා සේවා සහ නිෂ්පාදන සාධක හුවමාරු කිරීමේ දී අතරමැදියකු වශයෙන් කටයුතු කිරීම යි.

මෙම කාර්යය නිසා මුදල් වෙනත් වත්කම්වලින් පැහැදිලි ව වෙන් කොට හඳුනා ගත හැකි ය. භාණ්ඩ හුවමාරු ක්‍රමයේ (බාටර් ක්‍රමයේ) පැවති ද්විත්ව සමපාතය, ප්‍රවාහණය, ගබඩා කිරීම, කුඩා කොටස්වලට බෙදීම ආදී ගැටලු බොහොමයක් මුදල් භාවිතය නිසා නිරාකරණය විය.

හුවමාරුවට සම්බන්ධ වන දෙපාර්ශ්වයේ වුවමනා අන්‍යෝන්‍ය වශයෙන් ගැලපීම වුවමනාවන්ගේ ද්විත්ව සමපාතය නම් වේ.

ClassNote.LK

භාණ්ඩ හුවමාරු ක්‍රමයේ දී ද්විත්ව සමපාතයක් නොමැති විට ගනුදෙනුව සිදු කර ගැනීම අතිශය දුෂ්කර කාර්යයක් විය.

එහෙත් මුදල් භාවිතය නිසා ගනුදෙනුව සිදු කර ගැනීමේ දී මුදල් අතරමැදියකු සේ කටයුතු කරන හෙයින් ද්විත්ව සමපාතයක් අවශ්‍ය නොවේ.

මුදල් විනිමය මාධ්‍යයක් ලෙස භාවිත කිරීම නිසා ශ්‍රම විභජනය හා විශේෂීකරණය පුළුල් වූ අතර මහා පරිමාණ නිෂ්පාදනයට මඟ පෑදිණි.

ClassNote.LK

# වටිනාකමේ සන්නිධියත් ලෙස කටයුතු කිරීම

අවදානමකින් හා අපහසුතාවකින් තොර ව අනාගත අවශ්‍යතා සඳහා වටිනාකම රැස් කර තබා ගැනීම සඳහා මුදල් යොදා ගැනීම වටිනාකම් සන්නිධියක් ලෙස කටයුතු කිරීම යන්නෙන් අදහස් කෙරේ.

භාණ්ඩවලින් වටිනාකම රැස් කිරීමේ දී ගබඩා කිරීමේ අපහසුව, ඉක්මනින් නශ්‍ය වීම ආදී ගැටලු පැන නැඟුණ ද මුදල්වලින් වටිනාකම රැස් කිරීමේ දී එම දුෂ්කරතා ඇති නොවේ.

වටිනාකම රැස් කිරීමට වැඩි දෙනෙකු මුදල් භාවිත කරන්නේ මුදල් පූර්ණ ද්‍රවශීල වත්කමක් වන නිසා ය.

මුදලේ ක්‍රය ශක්තිය ස්ථාවර මට්ටමක පැවතීම මුදලේ මෙම කාර්යය වඩාත් කාර්යක්ෂම කරනු ඇත.

ClassNote.LK

# ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම

ගිණුම් ඒකකයක් ලෙෂ කටයුතු කිරීම යනුවෙන් අදහස් කරන්නේ සෑම භාණ්ඩයකම, සේවාවක ම, වත්කම්වල වටිනාකම් අතර වෙනස හඳුනාගත හැකි වීම හා හුවමාරු ක්‍රියාවලිය කාර්යක්ෂම ව සිදු කිරීමට හැකියාව ලැබීම ය.

මුදල් වටිනාකමේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම නිසා ව්‍යාපාර ගිණුම්කරණය, ජාතික ගිණුම්කරණය, රාජ්‍ය අයවැයකරණය, ගෙවුම් ශේෂ ලේඛනය සැකසීම ආදී මූල්‍ය වාර්තාකරණය පහසු වී ඇත.

ClassNote.LK

# විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම

විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම යන්නෙන් අදහස් කරනුයේ කල් පසු වී කරනු ලබන ගෙවීම් කාර්යක්ෂම ව සිදු කිරීමට මුදල් යොදා ගැනීමට ඇති හැකියාවයි. ව්‍යාපාර ආයතන භාණ්ඩ ණයට අලෙවි කිරීමේ දී හා මූල්‍ය ආයතන ණය සැකසීමේ දී එම ගෙවීම් සමාප්ත කිරීමට කාලයක් ගත වේ.

අවිනිශ්චිතතාවකින් හෝ අවදානමකින් තොර ව එම ගෙවීම් නිම කිරීමට මුදල් භාවිත කිරීම නිසා හැකියාව ලැබී ඇත.

මුදලේ අගය ස්ථාවර ව පැවතීම විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස මුදලේ කාර්යය වඩාත් කාර්යක්ෂම වීමට හේතු වේ.

ClassNote.LK

# වර්තමානයේ භාවිත වන මුදල් වර්ග

- ව්‍යවහාර මුදල්
- බැංකු මුදල්
- ආසන්න මුදල්
- මුදල් ආදේශක
- විද්‍යුත් මුදල් / ඩිජිටල් මුදල්

# ව්‍යවහාර මුදල්

ව්‍යවහාර මුදල් යනු යම් නෛසර්ගික වටිනාකමක් අන්තර්ගත නොවන නමුත් කිසියම් වටිනාකමක් නියෝජනය කිරීම සඳහා මූල්‍ය අධිකාරිය විසින් නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු වන අතර ව්‍යවහාර මුදල් රට තුළ ඕනෑ ම ගනුදෙනුවක් කිරීමට නීතියෙන් වලංගු වන අතර ව්‍යවහාර මුදල් පූර්ණ ද්‍රවශීලතාවකින් යුක්ත වේ.

ClassNote.LK

## බැංකු මුදල්

චෙක්පත් ලිවීම මගින් ප්‍රයෝජනයට ගත හැකි ඉල්ලුම් තැන්පතුවල ඇති මුදල් ශේෂය බැංකු මුදල් වශයෙන් හැඳින්වේ. බැංකු මුදල් තුළ ඉහළ ද්‍රවශීලතාවක් පවතී.

## ආසන්න මුදල්

වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කරන, එහෙත් හුවමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියා නොකරන ඉහළ ද්‍රවශීලතාවකින් යුතු වත්කම් අසන්න මුදල් ලෙස හඳුන්වයි. ආසන්න මුදල් පහසුවෙන් හුවමාරු මාධ්‍යයක් බවට (මුදල්) පෙරළා ගත හැකි ය.

ස්ථාවර තැන්පතු, ඉතුරුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු ආසන්න මුදල් සඳහා නිදසුන් ලෙස දැක්විය හැකි ය.

ClassNote.LK

## මුදල් ආදේශක

මුදල් ආදේශක වශයෙන් හඳුන්වනු ලබන්නේ වටිනාකමේ සන්නිධියක් වශයෙන් ක්‍රියා නොකරන නමුත් තාවකාලික ව හුවමාරු මාධ්‍යයක් වශයෙන් කටයුතු කරන උපකරණ වේ. ණයපත් හා හරපත් මුදල් ආදේශක සඳහා නිදසුන් වශයෙන් දැක්විය හැකි ය.

ව්‍යවහාර මුදල් හෝ චෙක්පත් හෝ භාවිතයක් නොමැති ව කෙටි කාලීන ගනුදෙනු සඳහා මෙම මුදල් ආදේශක යොදා ගත හැකි ය.

ClassNote.LK

## ණයපත්

යම් මූල්‍ය ආයතනයක් විසින් අනුමත වූ මුදල් සීමාවන් යටතේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමටත් අවශ්‍ය විටක මුදල් ලබා ගැනීමටත් අවසරය ලබා දී නිකුත් කරන විද්‍යුත් කාඩ් පත ණයපතකි.

## ණයපත් මුදල් ලෙස නොසැලකීමට හේතු

මුදල්වලින් ඉටු කරන සියලු කාර්යයන් ණයපත් මගින් ඉටු නොවීම

ණයපත් මගින් ගනුදෙනුකරුවා ට ලබා දෙන උපරිම ණය සීමාව ඉක්මවූ පසු තවදුරටත් ණයපත් ප්‍රයෝජනයට ගනිමින් ගනුදෙනු කිරීමට නම් අදාළ මූල්‍ය ආයතනය වෙත ණය මුදල ගෙවිය යුතු වීම (මුදල් ලෙස සැලකෙන්නේ මූල්‍ය ආයතනය වෙත ගෙවන මුදල් මිස ණයපත නොවේ).

ClassNote.LK

# <u>හරපත්</u>

හරපත් යනු ගනුදෙනුකරුවන් මූල්‍ය ආයතනයක යම් මුදලක් තැන්පත් කළ විට ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රයක් මගින් ආපසු මුදල් ගැනීමට වෙනත් ගිණුමකට මාරු කිරීමට භාවිත කරන උපකරණයකි.

හරපත් මුදල් ලෙස නොසැලකෙන්නේ මුදලින් ඉටු කරනු ලබන සියළු කාර්යයන් මෙමගින් ඉටු නොකෙරෙන නිසා ය.

ClassNote.LK

# විද්‍යුත් මුදල් / ඩිජිටල් මුදල්

මුදල්, විද්‍යුත් ක්‍රමය භාවිතයෙන් ගබඩා කර තබා මෘදුකාංගයක් මගින් ගනුදෙනු සඳහා යොදා ගන්නා ක්‍රමවේදය විද්‍යුත් මුදල් වශයෙන් හැඳින්වේ.

හරපත්, ණයපත්, E-banking, Easy Cash Bit coin විද්‍යුත් මුදල් සඳහා නිදසුන් ලෙෂ දැක්විය හැකි ය.

ClassNote.LK



පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
ECONOMICS
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු 27
ලියාපදිංචි වීමට :-
076 36 55 550
ඉරිදා
උදෑසන 8.30
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura